# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 6,932 — 1918ක්වූ මාර්තු මස 28වෙනි දිනවූ බෘහස්පතින්දා.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## උපාඩ්ගනීති.

මිනුවන්ගොඩ නගරාභිවෘද්ධික සභාව විසින් වර්‍ෂ 1898වේ නොම්මර 13වෙනි රෙකුලාසියේ 5(6)වෙනි වගන්තිය යටතේ මෙහි පහත අතුරුපණත් කාරක මන්ත්‍රණ සභාවේ කැමැත්ත පිට ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරන ලදින් පොදු ජනයාගේ දැනගැණීම පිණිස මෙයින් ප්‍රසිද්ධකරන්ට යෙදුනා ඇත.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,
ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වර්‍ගහ.

වර්‍ෂ 1918ක්වූ මාර්තු මස 23වෙනි දින
කොළඹ මහලේකම් කන්තෝරුවේදීය.

### සාමාන්‍ය කරුණු.

(a) සභාපතිතැනගෙන් ලබනලද අවසරපත්‍රයක් නොමැතිව කිසිම භෝජන ශාලාවක්, තේ හෝ කෝපිකඩයක් මස් විකුණන කඩයක්, මාලු විකුණන පලක්, ගවගාලක්, කිරි විකුණන ස්ථානයක්, අපුල්ලන ස්ථානයක් හෝ සාමාන්‍ය නවාතැන් පලක්, කොයිම ප්‍රදෙශයක, නගරයක සීමා තුළ තැබීම කිසිවෙකුට බැරීය. ඉහතකී ස්ථානයන් හරියාකාර පැවැත්වීම පිණිස පැවතිගෙණ එන ප්‍රදෙශක සභාවේ නීති හෝ පහත දක්වන අණපණත්වලටත් අනුව ක්‍රියාකිරීම අතපසුකරණ කාට තුමුත් එම අවසරපත්‍රය දීම ප්‍රතික්‍ෂෙපකිරීමට සභාපතිතැනට මෙයින් බලය දෙනලදී. එවැනි සෑම අවසරපත්‍රවලට එය නිකුත් කිරීමේ අන්තිම දිනයසි හගවන දෙසැම්බර් මස 31වෙනි දින තුරු හෝ එවැනි අවසර පත්‍රය අවලංගුකර දමනතුරු බලය ඇතිවේ. එවැනි අවසරපත්‍රය නීතිඥයක මන්ත්‍රණ සභාගත ආණ්ඩුකාරතැනගේ කැමැත්ත ඇතිව කලින්කල ප්‍රදෙශක සම්තිය විසින් අරමුණුකරණ ලබන ගාස්තු ගෙවීමට වැඩිදුරටත් බැදිතිබේ.

(b) ඉහතකී ස්ථානයන් හරියාකාර පැවැත්වීම පිණිස පැවති එන හෝ පහත දක්වන අණපනත් කඩකිරීමේ වැරැද්දට යම් අයෙක් යම් උසාවියක් විසින් දෙවනාවක් හෝ වැඩිගණනක් දඬුවම්කරණු ලැබුවේනම් සම්තියේ සභාපතිතැන විසින් මේ පරිච්ඡේදය යටතේ එම අයට නිකුත්කරණලද එම් අවසරපත්‍රය ඒ දෙවෙනි නඩුව හෝ ඊට පසු සිදුවන නඩු හෝ විනිශ්චය කරණ නඩුකාරතැන විසින් අවලංගුකරණු ලැබීමට බලය ඇතිවේ. එසේ අවසරපත්‍රයක් නඩුකාරතැන විසින් අවලංගුකළා පින් පසු එම අයට අභිනව අවසරපත්‍රයක් දීම තමාගේ කැමැත්ත ප්‍රකාර ප්‍රතික්‍ෂෙපකිරීමට ප්‍රදෙශික සම්තියේ සභාපති තැනට බලය මෙයින් දෙනලදී. එසේවුවද කොයිම ප්‍රසිද්ධ දෙපාතිමේන්තුවක් විසින් හෝ ඊට භාරව පවත්වනු ලබන කිසිම වෙළඳ ශාලාවක් තුළ තිබෙන කඩපලවල් මේ අණපණත්වලට අඩංගු නොවේ.

### භොජන ශාලා, තේ සහ කෝපිකඩ.

1. සියලුම භෝජන ශාලා, තේ සහ කෝපි කඩ සභාපතිතැන සතුටුවන අන්දමේ පිරිසිදුවද සනීපාරක්‍ෂක විධියටද තැබිය යුතුයි.

2. යම් කිසි භොජන ශාලාවකට හෝ තේ හෝ කෝපි කඩයකට අයිතිවූ හෝ ඒවායේ පාවිච්චියට ගනු ලබන භාජන, අරුමෝසම් බඩු සහ අනිකුත් උවමනා ද්‍රව්‍යයන් නිරන්තරයෙන්ම පිරිසිදුව තැබිය යුතුයි.

3. සියලුම භොජන ශාලා සහ තේ හෝ කෝපි කඩවලත් සියලුම බිත්ති කපරාරුකර සුදුහුණු ගෑයුතුයි. තවද කාමර යහපත්සේ වාතාශ්‍රයෙන් සහ ආලෝකයෙන්ද යුක්තකළ යුතුයි.

4. යම්කිසි භොජන ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක මිදුල්වල සහ ඒ අවට තිබෙන සියලුම කුණු සහ කසල දවසකට දෙවරක් බැගින් ඉවත දැමිය යුතුයි.

5. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ භෝජන ශාලාව හෝ තේ හෝ කෝපිකඩය භාරව සිටින තැනැත්තා දැනුවත්ව බෝවෙන රෝගයකින් ලඟදීම පෙලීසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයෙකුට සාත්තුකිරීමෙහි ලඟදී යෙදී සිටියාවූ කෙනෙකු එවැනි භොජන ශාලාවේ හෝ තේ හෝ කෝපි කඩේ ඇතුළේ හෝ ඒ අවට වැඩෙහි නොයෙදිය යුතුයි.

6. එවැනි ස්ථානයන්හි පාවිච්චිකරණ සීනි විදුරු මූඩි ගසනලද පළල් කටවල් ඇති බෝතලවල තැබිය යුතුයි.

7. විකිණීමට තබනලද සියලුම කේක්, රසකැවිලි යනාදිය මැස්සන්ගෙන් නිදහස්කොට තිබිලෙස සාදනලද විදුරු පෙට්ටිවල තැබිය යුතුයි. කිසිම කෑම ද්‍රව්‍යයක් මැස්සන් විසින් අපිරිසිදු කරණු ලැබීමට නොහැරිය යුතුයි. පාවිච්චි කරණු ලබන විදුරු පෙට්ටි ඉතා පිරිසිදුව තැබිය යුතුයි.

8. අහකයන තේ, කෝපි හෝ කිරි හෝ කෑමවල ඉතිරි කැබලි, පිසීමේදී අහකයන ද්‍රව්‍යයන් ඊට නිසි භාජනයක එක්කාසුකර දිනපතාම ඉවත්කරණු මිස භූමියෙහි විසිනොකළ යුතුයි.

9. කිසිම භෝජන ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක නරක කිරි විකිණීම හෝ දීම හෝ විකිණීමට තැබීම හෝ ඒවා එහි ඇතුළත තැබීම හෝ නොකළ යුතුයි.

මේ පණත අනුව නරක කිරීයයි කියන්නේ පැමිණෙන්නන්ගේ එවේලේම පාවිච්චිය පිණිස හෝ කෝපි හෝ වෙනත් බීමක් සුදානම්කිරීමට නොව එහි ප්‍රමාණය වැඩිකිරීමට හෝ එහි කිසි ගුණය අඩිකකිරීමට අදහස්කර වතුර හෝ රටබීම හෝ වෙන ද්‍රව්‍යයක් මිශ්‍රකරණලද කිරිවේ.

10. මෙම අණපණත් රාමුවක දමා සෑම භෝජන ශාලාවේ හෝ තේ හෝ කෝපි කඩේ හරියාකාර පෙණෙන ස්ථානයක එල්ලා තැබිය යුතුයි.

ගාල්.

1. බලය දෙනුලැබූ සෑම ගාලම සභාපතිතැන විසින් ලියාපදිංචිකළ යුතුයි. "නොම්මර ........ ලියාපදිංචිකරණලද ගාල" යන වචන සහ අයිතිකාරයාගේ නම පින්තාරුකරණලද දූන්වීම් ලෑල්ලක් බලයලත් නැනැත්තා විසින් එවැනි සෑම ගාලේම ඇතුල්වන ස්ථානයෙහි එල්ලා තැබිය යුතුයි.

2. සෑම ගාල හෝ කරත්ත හෝ ගවයින් නවත්වන ස්ථානයන්හි සභාපතිතැනට සතුටු උපදවන අන්දමේ එක ප්‍රමාණයට මට්ටම්කර නිසියාකාර කාණු දූමිය යුතුයි. බිම මතුපිට තදව මට්ටමට තිබෙනාකාර සිමෙන්තිදමා හෝ ගල්කැලි අල්ලා හොඳකාර සවිව තැබිය යුතුයි. එවැනි ගාලක හෝ ගවයින් හෙවත් වෙන සතුන් තැබීමට පාවිච්චිකරණුලබන ස්ථානයන්හි තිබෙන සියලුම ගොඩනැගිලි 3වෙනි පණත අනුව තිබීමට සෑදීම සහ තැබීම කළයුතුයි. එවැනි ගාල හෝ නවත්වන ස්ථාන දිනපතා හොඳකාර පවිත්‍ර කරණු ලබන අතරම පිරිසිදුව සහ සනීපාරක්ෂක අන්දමට තබාගත යුතුයි. තවද ගොම සහ කුණුකසලත් මිනිසුන් වාසයකරණ යම්කිසි ගෙවලින් ඈත සභාපතිතැන පිළිගන්නා ස්ථානයකට දවස්පතාම ඉවත්කළ යුතුයි. දිනපතා පවිත්‍රකිරීමට බාධාවන්නාවූ කිසිම බඩුවක් හෝ ලීදඬු ආදියක් හෝ වෙන යම් ද්‍රව්‍යයක් එවැනි ගාලක හෝ නවත්වන ස්ථානයක නොතැබිය යුතුයි.

3. ඉස්තාලයක් හෝ ගවමඩුවක් හෝ ගවයින් නවත්වන ස්ථානයක් හැටියට පාවිච්චිකරණු ලබන සෑම ගොඩනැගිලි හෝ මඩු අයිතිකාරයා හෝ බදුකාරයා හෝ එහි පදිංචිකාරයා සභාපතිතැනට සතුටුදායක වනාකාර සෝදාහරින දේ හෝ මූත්‍රා හෝ වැසි වතුර ගලායාමට නිසියාකාර සිමෙන්ති දමනුලැබූ කාණු සෑදිය යුතුයි. එසේද වුවත් සභාපතිතැනට උවමනායයි කල්පනා වේනම් එම කාණුවලින් යන මූත්‍රා හෝ සෝදා දමන දේවල් සභාපතිතැන විසින් අණකළ පරිදි සාදනලද්දාවූද වැසුවාවූද භාජනයකට හෝ භාජනවලට වැක්කෙරෙණසේ එම කාණු සෑදීමට සභාපතිතැනට අණකරන්ට පුළුවන. ඒවාගේ තිබෙන කුණු එම අයිතිකාරයාගේ හෝ බදුකාරයාගේ හෝ පදිංචිකාරයාගේ වියදමින් දිනපතාම ඉවත්කර එයින් කිසිම බාධාවක් නොවන ක්‍රමයකට නැතිකර දූමීමට සැලැස්විය යුතුයි. එවැනි ගොඩනැගිල්ලක බිම සිමෙන්ති හාමු ගඩොල්වලින් හෝ ගලින් හෝ සිමෙන්ති හා කළුගල්වලින් හෝ පහසුවෙන්ම පිරිසිදුව තබාගත හැකි සවිඇති වෙනයම් ද්‍රව්‍යකින් සකස් කොට හොඳකාර අලුත්වැඩියා කරමින් තබාගත යුතුයි. එවැනි ගොඩනැගිල්ලක් සුදුහුණු ගෑහැකි ක්‍රමයට සාදා තිබේනම් එය හයමාසයකට වරක් හෝ සභාපතිතැන අණකරණ යම් වාරගණනක් එසේ කළයුතුයි. එසේවුවත් එවැනි ගොඩනැගිල්ලේ හෝ මඩුවේ පටන් වාසයකරණ ගෙයකට ඇති දුර හෝ වෙනයම් කාරණවක් හේතුකොට ගෙණ සභාපතිතැන එවැනි දෙයක් උවමනා නැතැයි සිතානම් යථොක්ත අණපණත්වලින් ඕනෑම එකක් ගැණ සභාපතිතැනට බුරල දියහැකිය. වැඩි දුරටත් සභාපතිතැනට උවමනායයි සිතේනම් ඉස්තාලයක්, ගවමඩුවක් හෝ ගවයින් නවත්වන ස්ථානයක් හැටියට පාවිච්චිකරණු ලබන ඕනෑම ගොඩනැගිල්ලක් ගලින්, ගඩොලින් හෝ වෙන පවතින ද්‍රව්‍යයකින් සෑදීමටද උළුසෙවිලි කරණලද හෝ යකඩ වහලක් දූමීමටද අණකිරීමට සභාපතිතැනට පුළුවන.

4. සෑම ඉස්තාලය ගවමඩුව හෝ ගවයින් නවත්වන ස්ථානය දිනපතා හොඳින් පවිත්‍රකර පිරිසිදු සහ සනීපාරක්ෂක අන්දමේ තැබිය යුතුයි. තවද ගොම සහ කුණුකසල වාසයකරණ ගෙවලින් ඈත සභාපතිතැන විසින් පිළිගන්නා ස්ථානයකට දින පතාම ඉවත්කර දූමිය යුතුයි.

5. සෑම ගාලම සභාවේ මූලාදෑනින්ට හෝ සභාපතිතැනට හෝ ලියවිල්ලකින් බලය දෙනලද වෙන කෙනෙකුට හෝ ඕනෑවිටක පරීක්ෂාකරණු ලැබීමට අවකාශ දියයුතුයි. මේ අතුරුපණත් යටතේ සම්පාදනයකිරීම පිණිස සභාපතිතැනට බලයදී තිබෙන සියලුම අණ, ලියවිලිවලින් යුක්තාවිය යුතුයි.

කිරි වෙළඳම්පලවල්.

1. අතුරුපණත් උදෙසා කිරි වෙළඳම්පල යන්නෙන් කිරි සපයනු ලබන්නාවූද විකිණීම පිණිස කිරි තබා තිබෙන්නාවූද යම්කිසි ගවයින් ඇතිකරණ ස්ථානයක්, ගවයින් ඇතිකරණ ස්ථානයක ඇති ගෙයක්, එළදෙනුන් බඳින මඩුවක්, කිරි ගබඩාවක්, කිරි කඩයක් හෝ කිරි සපයන අන් කිසියම් ස්ථානයක් හඟවන්නේය. "කිරිකාරයා" යන්නෙන් යම් එළදෙන්නු ඇතිකරන්නෙක් කිරි ගෙණයන්නෙක් හෝ කිරි වෙළඳම්පලක පදිංචිකාරයෙක් අන්තර්ගතවේ. තවද කිරි වෙළඳම්පලක් එක්කෙනෙකුට වඩා වැඩි ගණනකට අයිතිවී තිබේනම් එවැනි අවස්ථාවන්හිදී එවැනි කිරි වෙළඳම්පලේ කළමනාකාරයා හෝ එහි සැබවින්ම කළමනාකරණ වෙන අයෙක් "කිරිකාරයා" යන්නෙන් හඟවන්නේය.

2. ඇර තිබෙන ආවාට සහිත වැසිකිළියකට හෝ බිම මතුපිට වැසිකිළියකට අඩි සියයක් ඇතුළත තිබෙන භූමියක හෝ නරක වාෂ්පය ඊට ලඟාවෙන ස්ථානයක හෝ කිසිම කිරි වෙළඳම්පලක් නොතැබිය යුතුයි. තවද කිරි වෙළඳම්පලකට අඩි සියයක් ඇතුළත ඇර තිබෙන ආවාට සහිත වැසිකිළියක් හෝ බිම මතුපිට වැසිකිළියක් නොසෑදිය යුතුයි.

3. කිරිවෙළඳම්පලවල මිදුල් සභාපතිතැනට සතුටුදායක වන අන්දමේ නිසියාකාර සෑහෙන පමණ කාණුවලින් යුක්තවිය යුතුයි. තවද කාණුවලට වතුර ගසා සේදිය යුතුයි. කිසිම කිරි වෙළඳම්පලක් අවට භූමියේ අපිරිසිදු වතුර එකතුවී තිබෙන්ට ඉඩනෑරිය යුතුයි.

4. කිරි වෙළඳම්පලක් ඇතුලේ සහ එහි මිදුල්වලත් තිබෙන කුණු කසල සියල්ලම කිසිම ප්‍රමාදයක් නැතුව ඉවතට දූමිය යුතුයි. ගොම දිනපතාම ඉවත්කළ යුතුයි.

5. සෑම කිරි වෙළඳම්පලේම පාවිච්චිය පිණිස පිරිසිදුවූ ආරක්ෂාකරනලද වතුර පහසු පමණ දුරින් සපයා තැබිය යුතුයි. මේ ජලස්ථානය සමීපයෙහි ස්නානයකිරීම හෝ රෙදි සේදීම නොකළයුතුයි.

6. කිරි එළදෙනුන් සහ මීදෙනුන් ලෙඩවලින් තොරවී සිටිය යුතුයි. තවද බෝවෙන රෝගයකින් පෙලෙන්නාවූ හෝ කිරි වෙළඳම්පලක් භාරකාරයා දූනුවත්ව එවැනි රෝගයකින් ළඟදී පෙළිසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙලෙන රෝගාතුරයෙකුට සාත්තුකිරීමෙහි ළඟදී යෙදීසිටියාවූ කිසිවෙකු කිරි වෙළඳම්පල භාරව සිටින එවැනි අය විසින් එම කිරි වෙළඳම්පලේ මෙහෙකිරීමෙහි යොදනුලැබීමට අවසරනොදිය යුතුයි.

7. කිරිදෙවීමට පෙර දෙනුන්ගේ කිරි බුරුලු සහ තනපුඩුත් සෝදනවාද යනු සියලුම කිරි වෙළඳම්පලවල් භාරකාරයන් විසින් බැලිය යුතුයි. තවද කිරි දෙවන්නා කිරි දෙවීමට පෙර ඔහුගේ අත් සබන් සහ වතුරෙන් හොඳකාර සෝදාගත යුතුයි. ගොමෙන් හෝ මූත්‍රාවලින් කිරි අපිරිසිදු නොවීමට සෑම ආකාරයෙන්ම ප්‍රවේසම් ගතයුතුයි.

8. කිරි වෙළෙන්දෙකු හෝ කිරි වෙළඳම්පලක් අයිතිකාරයෙකු විසින් කිරිවලට වතුර හෝ වෙන යම් පරදේශික දිය ජාතියක් හෝ ද්‍රව්‍යයක් හෝ මිශ්‍ර කොට කිරි දූෂ්‍යනොකළ යුතුයි. තවද ඔහු විසින් එසේ කරණලද කිරි විකිණීම හෝ විකිණීමට තිබීම හෝ නොකළ යුතුයි.

9. කිරි වෙළඳම්පලකට අයිතිවූ හෝ එහි පාවිච්චිකරනු ලබන භාජන, බඩු සහ අනිකුත් උපකරණ පවිත්‍රලෙස තැබිය යුතුයි.

10. කිරි සහිතව පිට අරිනු ලබන සියලුම භාජන ඉතා පවිත්‍රලෙස සහ නිසියාකාර වසා පිරිසිදු ද්‍රව්‍යයන්ගෙන් ඇබ ගසා තිබියයුතුයි. තවද ඒ භාජන කිසිල්ල යට තබාගෙන නොයායුතුයි. තවද බෝතල කටවල ඇඟිලි ගෑසීම නොකළයුතුයි.

11. ගවයින් තබනුලබන මඩු සහ ගෙවල් හාල් සම්බන්ධ තිබෙන ප්‍රදේශික සමිතියේ පණත්වලින් 3වෙනි පණතේ පෙනෙන කාරනාවලට අනුව සහ ඒට යටත්ව තිබියයුතුයි.

12. කිරි වෙළෙඳාම්පලකට අවසර පත්‍රයක් ලබාගත් සෑම අයටම කිරි තැබීමට සහ සූදානම්කිරීම පිණිස එළදෙනුන්ගේ මඩුවලින් ඈත ප්‍රදේශික සමිතියේ සභාපතිතැන විසින් මැනවයි පිළිගන්නා දුර ප්‍රමාණයක සහ ස්ථානයක සාදනලද කිරි කාමරයක් තිබිය යුතුයි. එහි ඔහුගේ වෙළෙඳාම සම්බන්ධව පාවිච්චිකරණ සියලුම භාජන පවිත්‍රකළායින් පසු තැබිය යුතුයි. ගෙබිම සහ බිත්තිත් හාවෙන ස්ථානයෙහි කවාකාර මූළු ඇතිව ගෙබිමට සිමෙන්ති දැමිය යුතුයි. බිත්ති කපරාරුකර ගලින් හෝ සිනිඳු ලෑලිවලින් හෝ යකඩවලින් සාද පභාපතිතැන විසින් හෝ ප්‍රධාන සනීපාරක්ෂක මුලාදෑනිතැන විසින් හෝ අණ කරනුලබන ආකාර කලින් කල සුදු හුනු හෝ තීන්ත ගෑම කළයුතුයි, අඩු ගණනේ කිරි කාමරයක එකිනෙක ඉදිරිපිට තිබෙන බිත්ති දෙකක්වත් එළිමහනට තැබිය යුතුයි. දූලි ඇතුළට ඒම වළක්වන පිණිස වද්දවනලද ලෑලිවලින් වහලට සිලිං ගැසියයුතුයි. එහි අඩු ගණනේ එක දොරක් සහ එක කවුළුවක්ද තිබිය යුතුයි. වීදුරු හෝ වහන පියන් රහිත අඩි 3ක් දිග සහ 2ක් පළල ජනේල තබා මැස්සන්ට යානොහැකි දැල් සවිකළයුතුයි. දොර ජනේලය ඉදිරිපිටින් තැබිය යුතුයි. තවද දොර කිච්චුකර වද්දවා මැස්සන් නොයන ලෙස දැල් ගසා වසා තැබියයුතුයි. ගල්ලෑලි හෝ සින්ක්තහඩු හෝ පිළිගන්නාලද දිය කාන්දුනොවන වෙන යම් ද්‍රව්‍යයකින් වසනලද මේසයක් කිරිකාමරයේ තැබිය යුතුයි. මේ කාමරය කිරි තැබීමට සහ සූදානම් කිරීමට හැර වෙන කිසිම වැඩකට පාවිච්චිනොකළ යුතුයි.

13. කිරි වෙළෙඳාම්පලකට අවසරයගත් සෑම අයම ඔහුගෙන් කිරි ගන්නා අයගේ නම් ලේඛනයක් තැබියයුතුයි. එය ප්‍රදේශික සමිතියේ සභාපතිතැන විසින් හෝ ප්‍රධාන සනීපාරක්ෂ මුලදෑනිතැන හෝ ඔහුගේ උප මුලාදෑනීන් විසින් පරීක්ෂා කරනු ලැබීමට අවකාශ ඇතිසේ තැබියයුතුයි.

14. එක එක කිරි වෙළෙඳාම්පලට තබාගන්ට අවසරදී තිබෙන එළදෙනුන් ගණන එම අවසරපත්‍රයේ සඳහන්කරනු ලැබිය යුතුයි.

15, ප්‍රථමයෙන් සභාපතිතැනගෙන් ලබාගන්නාලද අවසරයක් නොමැතිව කිරි වෙළෙඳාම්පලක් පිහිටි ස්ථානය මාරු කිරීම හෝ අවසර පත්‍රයේ සඳහන්වන ස්ථානයේ හැර වෙන ස්ථානයක කිරි දෙවීම හෝ කිරි වෙළෙඳාම්පලකට අවසරගත් කිසිම කෙනෙකු විසින් නොකළ යුතුයි.

16. පරීක්ෂක මුලාදෑනීන් කිරිපල බලන්ට ආවිටක ඔවුන්ගේ රපෝර්තු ලියා තැබීම පිණිස කිරි වෙළෙඳාම්පලකට අවසරගත් සෑම අයම ඔහුගේ කිරි කාමරයේ රපෝර්තු පොතක් තැබිය යුතුයි.

17. සනීපාරක්ෂක නගර සීමාතුළ හෝ එවැනි සීමාව පිටත හෝ පිහිටා තිබෙන සෑම කිරි වෙළෙඳාම්පලම පසුව සඳහන් තැන්වලින් නගර සීමාතුළ අයට කිරි සපයානම් සභාපතිතැන විසින් ලියා පදිංචිකරනුලැබේ. එක එක ඉල්ලුම්කාරයාට ඔහුගේ නම සහ නොම්මරයක් දරණ පත්‍රයක් සභාපතිතැන විසින් දෙනුලැබේ. මේ පත්‍ර බලයලත් මුලාදෑනීන් විසින් හෝ සනීපාරක්ෂක පරීක්ෂකයන් විසින් හෝ බලන්ට ඉල්ලූවිටක පෙන්විය යුතුයි.

18. ප්‍රදේශික සමිත්යේ සභාපතිතැන ප්‍රධාන සනීපාරක්ෂක මුලාදෑනිතැන හෝ ඔහුගේ උපමුලාදෑනියා හෝ පලාතේ ප්‍රධාන මුලාදෑනියා හෝ ප්‍රදේශික සමිතියේ සභාපතිතැන විසින් හෝ සනීපාරක්ෂක මුලාදෑනිතැන විසින් යම් කිසි ප්‍රදේශික නගරයක සනීපාරක්ෂා සම්බන්ධව සෝදිසිකිරීමට බලයදෙනලද යම් කිසි සනීපාරක්ෂක පරීක්ෂකයෙක් ප්‍රදේශික නගර සීමා තුළ අවසරලත් කිරි වෙළෙඳාම්පලකින් හෝ කිරි වෙළෙඳාම්කරන්නාවූ හෝ විකිණීමට තබාසිටින්නාවූ කෙනෙකුගෙන් පරීක්ෂා කරනුලැබීම පිණිස කිරි ටිකක් ගැනීමට සෑමකල්හිම බලය දෙනුලබන්නේය.

19. මෙම අතුරු අණපනත්වල පිටපතක් සෑම කිරි වෙළෙඳාම්පලේම කිරි කාමරයේ එල්ලා තැබිය යුතුයි.

### ඇඳුම් අපුල්ලා මදින ස්ථාන.

1. මෙම අණපනත් උදෙසා "ඇඳුම් අපුල්ලා මදින ස්ථානය" යන්නෙන් කුලියට අනුන්ගේ ඇඳුම් අපුල්ලන රක්ෂාව කරණ යමෙකු වාසයකරන ගේදොර හඟවන්නේය. "අපුල්ලන්නා" යන්නෙන් එවැනි කෘත්‍යයක යෙදී සිටින කෙනෙකු හෝ එවැන්නෙකුගේ මෙහෙකරුවෙකු හෝ ඔහුගේ ආධාරකාරයා හඟවන්නේය.

2. සභාපතිතැන විසින් ඕනෑකළවිටක කිලුටු රෙදි තබාගැනීම පිණිස වෙනම කාමරයක් සෑම අපුල්ලන්නන් විසින්ම සූදානම්කර තැබියයුතුයි. තවද එකී කාමරය හොඳකාර වාතය ගමන්කිරීමට සලස්වා පිරිසිදුව තබාගතයුතුවත්හැර අවුරුද්දකට දෙවතාවක් බැගින් සුදු හුණු ගෑ යුතුයි.

3. වාසයකිරීමට පාවිච්චිකරණ කිසිම කාමරයක අපුල්ලන්නා විසින් කිලුටු රෙදි නොතැබියයුතුයි.

4. මහජනයාගේ සනීපයේ යහපත සඳහා සභාපතිතැන උචිත්නායයි සිතන්නෙහිනම් රෙදි අපුල්ලන පිණිස විශේෂ ස්ථාන වෙන්කර තබනවා ඇත. එවැනි ස්ථාන දැන්වීම් ලෑල්ලකින් පෙන්නුම්කරනු ලැබේ.

5. අපුල්ලන කෙනෙකුට හෝ ඔහුගේ ගෙයි වැසියෙකුට හෝ යම් කිසි වසංගත නොහොත් බෝවෙන්නාවූ රෝගයක් වැළඳුනිනම් පැය 24ක් ඇතුළතදී ඒ බව ප්‍රදේශික සමිතියේ සභාපතිතැනට සනීපාරක්ෂක පරීක්ෂකතැන මගින් හෝ පොලිස් මුලාදෑනියා මගින් හෝ දැනුම්දිය යුතුයි.

6. යම් අපුල්ලන කෙනෙකුට හෝ ඔහුගේ ගෙදර වැසියෙකුට හෝ යම්කිසි වසංගත නොහොත් බෝවෙන රෝගයක් වැළඳුනකල අපුල්ලන ස්ථානයෙහි වැඩ එකෙණෙහිම නැවැත්විය යුතුයි. එබඳු රෝගයක් පටන්ගත් පසුත් පවත්නාතුරුත් සභාපතිතැනගේ විශේෂ අවසරය පිට මිස අපුල්ලන ස්ථානයට ඇඳුම් ගෙනඒම හෝ එයින් පිටතට ගෙනයාම නොළකයුතුයි.

7. යම් ගෙයක වැසියෙක් බෝවෙන රෝගයකින් පෙළෙන බව විශ්වාසකිරීමට කාරණ තිබේනම් ප්‍රදේශික සමිතියේ සභාපතිතැනගෙන් හෝ ප්‍රධාන සනීපාරක්ෂක මුලාදෑනිතැනගෙන් අවසරය නැතිව එවැනි ගෙයකින් කිලුටු රෙදි ගැනීම කිසිම අපුල්ලන්නෙකු විසින් නොකළයුතුයි.

8. ප්‍රදේශික සමිතියේ සභාපතිතැන විසින් හෝ ප්‍රධාන සනීපාරක්ෂක මුලාදෑනිතැන විසින් හෝ ඔහුගේ උප මුලාදෑනියෙකු විසින් ඕනෑකළකල සෑම අපුල්ලන්නාම ඔහු රෙදි සෝදන අයවලුන්ගේ නාම ලේඛනයක් දියයුතුයි.

### පොදු නවාතැන් ගෙවල්.

1. මෙම අතුරු අනපණත් උදෙසා පොදු නවාතැන් ගෙවල් යන්නෙන් පවුලේ සාමාජිකයන් නොවන හතර දෙනෙක් හෝ වැඩිගණනක් කුලියට නවත්වාගන්නා ගෙයක් හෝ ගෙයකින් කොටසක් හඟවන්නේය.

2. පොදු නවාතැන් ගෙයක් සවිකොට සාද හොඳකාර අළුත්වැඩියාකරමින් තබාගත යුතුයි. තවද නිදාගන්න කාමර සභාපතිතැනට සතුටු උපදවන අන්දමට හොඳකාර වාතය ගමන්කිරීමට ඉඩඇතුවද එළිය ඇතුවද තැබිය යුතුයි. තවද එහි බිත්තිවල අවුරුද්දකට තුන්වරක් බැගින් සුදු හුණු ගෑයුතුයි.

3. පොදු නවාතැන් ගෙයක් භාරකාරයා නිතරම ඒ ස්ථානය පවිත්‍රලෙස සහ සනීපාරක්ෂක අන්දමටත් තබාගතයුතුයි. කුණු කසල සහ අනතුරුය සහිත ද්‍රව්‍යයන් සියල්ලම එම ස්ථානයෙන් ඉවත්කිරීම කරවියයුතුයි.

4. පොදු නවාතැන්පලක සිටින කිසිවෙක් වසංගත නොහොත් බෝවෙන රෝගයකින් ලෙඩවූවිට නවාතැන්පල් කාරයා විසින් හෝ එවැනි අය විසින් හෝ සනීපාරක්ෂක පරීක්ෂකතැන මගින් හෝ පොලිස් මුලාදෑනියා මගින් හෝ ඒ බව නිසි බලයලත් මුලාදෑනිතැනට වහාම දැන්විය යුතුයි. තවද නවාතැන්පල හැරයාම සඳහා හෝ ඇඳ ඇතිරිලිවලද, ඇඳුම්වලද, අන්‍ය ද්‍රව්‍යවලද රෝග බෝවීමට හේතුවූ දේ විනාශකිරීම සඳහාද ගෙයට දුම් ඇල්ලීම, එහි රෝග බෝවීමට හේතු දේ නැති කිරීම සහ සුදු හුනු ගෑම සඳහාද නිසි බලයලත් මුලාදෑනියා විසින් කරනු ලබන අණවලට ඔහු කීකරුවිය යුතුයි.

5. සහවාසික අයට සෑහෙන පමණ වැසිකිළි තබාගැනීම සහ ඒවා සනීපාරක්‍ෂක අන්දමට තැබීම ගැණත් පොදු නවාතැන්පල් භාරකාරයා වගකියුතුය.

6. යම්කිසි පොදු නවාතැන්පලක නැවතීමට ඉඩඇති අයවළුන්ගේ ගණන නියමයකිරීමට ප්‍රදෙශික සමිතියේ සභාපතිතැනට මෙයින් බලය දෙනලදී. තවද එබඳු ගණන අවසර පත්‍රයේ සඳහන්කරණු ලැබේ. එබඳු ගණන අධිකවීමට ඉඩ හරින යම්කිසි පොදු නවාතැන්පලක් භාරකාරයෙක් නීති විරෝධි දෙයක්කිරීමේ වරදකාරයෙකු වෙනවා ඇත. මේ අතුරු පණතේ අදහස පිණිස වයස අවුරුදු දොළහෙන් පාත ළමයින් දෙදෙනෙකු එක අයෙකුමෙන් ගණන්ගනු ලැබේ.

7. ප්‍රදෙශික සමිතියේ සභාපතිතැන විසින් හෝ ප්‍රධාන සනීපාරක්‍ෂක මුලාදෑනිතැන විසින් හෝ ඔහුගේ උප මුලාදෑනිතැන විසින් හෝ කොට්ඨාසයේ ප්‍රධාන මුලාදෑනිතැන විසින් හෝ පොදු නවාතැන්පලක් පිහිටා තිබෙන ප්‍රදෙශික නගරයක සෞඛ්‍යය පරීක්‍ෂණයන් කිරීමට ප්‍රදෙශික සමිතියේ සභාපතිතැන විසින් හෝ ප්‍රධාන සනීපාරක්‍ෂක මුලාදෑනිතැන විසින් පත්කරණලද සනීපාරක්‍ෂක පරීක්‍ෂකයෙකු විසින් සෝදිසිකරනුලැබීමට අවකාශඇති ආකාර පොදුනවාතැන්පල තැබියයුතුසි.

## සෝදන ස්ථාන.

1. කරණලද යෝජනාවකින් යොග්‍යයයි සිතෙන ආකාර කලින් කලට අශ්වයින් සහ ගවයින් සේදීම පිණිස ස්ථාන වෙන්කර තැබීමට සහ ඒවා පාවිච්චිකරණ වේලාවල් නියම කිරීමටද සභාවට ව්‍යවස්ථානුකූලවේ.

2. එයාකාර වෙන්කරනු ලබන ස්ථානවල ලෙඛණයක් ඉංග්‍රිසියෙන්, සිංහලෙන් සහ දෙමළෙන්ද ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිඞකරණු ලැබේ. තවද නගර සීමාතුළ අණබෙර ගැසීමෙන්ද ප්‍රකාශකරණු ලැබේ. තවද යටකියනලද භාෂා තුනෙන්ම ලෙඛණයේ කෙටුම්පතක් කන්තෝරුවේ අලවා තබනු ලැබේ.

3. සමිතිය විසින් මෙසේ වෙන්කරනු ලබන ස්ථානවල හැර වෙන කිසියම් ප්‍රසිඞ ස්ථානයක අශ්වයින්, ගවයින්, රෙදි හෝ පැදුරු සේදීම කිසිවෙකු විසින් නොකළයුතුසි.

4. වසංගත නොහොත් බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ ඉහතකී ආකාර වෙන්කර තබනලද සෝදන ස්ථානයක් භාරකාර යම් කිසිවෙක් දැනුවත්ව එබඳු රෝගයකින් ලහදීම පෙළී සිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන රෝගාතුරයෙකුට සාත්තුකිරීමෙහි ලහදී යෙදී සිටියාවූ හෝ කිසිවෙකුට එබඳු සෝදන ස්ථානයක් භාරකාරයෙකු විසින් එබඳු සෝදන ස්ථානයක රෙදි හෝ වෙන ද්‍රව්‍යයක් සේදීමට ඉඩනොදිය යුතුසි.

## ප්‍රසිඞ නානතැන්.

1. මේ පණත් උදෙසා ප්‍රසිඞ නාන තැනක් යන්නෙන් :—මුදල් ගෙවා හෝ නොගෙවා මහජනයා හෝ යම්කිසි විශෙෂ පඞක්තියකට අයත් අයවළුන් නාන යම් ස්ථානයක් හෝ දෙවෙනි පණතේ ප්‍රකාර ප්‍රදෙශික සමිතියේ අණපිට විශෙෂවශයෙන් වෙන්කරණලද යම් ස්ථානයක් හඟවන්නේය.

2. ප්‍රදෙශික සභාවේ බලය පවතින යම් ප්‍රසිඞ ස්ථානයක් හෝ එයින් කොටසක් ප්‍රසිඞ නාන ස්ථානයක් හැටියට පාවිච්චිකරණුලැබීම පිණිස වෙන්කරතැබීමට කරණලද යෝජනාවක මාර්ගයෙන් සමිතියට හැකිවේ. තවද එවැනි ප්‍රසිඞ නාන ස්ථානයක මායිම් හා සම්බන්ධවනතැන් විස්තරකිරීමටද සභාවට පුළුවන.

3. යම් ප්‍රසිඞ නාන තැනක් පාවිච්චිකිරීම පිණිස එහි අයිතිකාරයා හෝ භුක්තිවිඳින්නා විසින් ගාස්තුවක් අයකරණු ලබණ සෑම ප්‍රස්ථාවකදීම එවැනි අයිතිකාරයා හෝ භුක්තිවිඳින්නා ප්‍රදෙශික සභාවේ සභාපතිතැනගෙන් අවසරපත්‍රයක් නොමැතිව එබඳු නාන ස්ථානයක් නොතැබිය යුතුසි. මෙම අතුරුපණත් හෝ පවතින්නාවූ යම් කිසි ප්‍රදෙශික සභා පණතකට අනුව ක්‍රියා කිරීම අතපසුකරණ යමෙකුට එම අවසරපත්‍රය නොදීමට සභාපතිතැනට මෙයින් බලය දෙනලදී. වැඩිදුරටත් මන්ත්‍රණ සභා ප්‍රාප්ත ආණ්ඩුකාරයානන්ගේ කැමැත්ත ඇතුව ප්‍රදෙශික සමිතිය විසින් කලින්කලට නියම කරණ යම් කිසි ගාස්තු ඇද්ද ඒවා ගෙවීමට එම අවසරපත්‍රය යටත් වෙනවා ඇත.

4. මේ අණ පණත් කඩකිරීම ගැණ යම් අයෙක් යම් කිසි උසාවියක් විසින් දෙවරක් හෝ ඊට වැඩිවරක් දඬුවම් කරණු ලබන්නේනම් දෙවෙනි හෝ ඊට අනතුරුව සිදුවන දඬුවම් ලියාතබන උසාවිය විසින්, මේ පරිච්ඡෙදය යටතේ ප්‍රදෙශික සමිතියේ සභාපතිතැන විසින් නිකුත්කරණලද එබඳු අවසරපත්‍රය අවලංගු කරදැමීම ව්‍යවස්ථානුකූලවේ. එසේ උසාවියක් විසින් අවසරපත්‍රයක් අවලංගු කරණු ලැබූ කල්හි එබඳු අයට යම් කිසි අභිනව අවසරපත්‍රයක් දීම ප්‍රදේශික සභාවේ සභාපතිතැනගේ කැමැත්තේ ප්‍රකාර ප්‍රතික්‍ෂෙප කිරීමට සභාපතිතැනට මෙයින් බලය දෙනලදී.

5. මේ පණත්වලින් උවමනාකරණලද දේවල් හරියාකාර කරණුලැබේද යනු බැලීමට යම් කිසි ප්‍රසිඞ නාන ස්ථානයක අයිතිකාරයා හෝ භුක්තිවිඳින්නා බැඳීසිටිනුලැබේ.

6. ප්‍රසිඞ නාන ස්ථානයකට වතුර ළිඳකින් සපයනුලබනකල්හි එම ළිඳ වටේට අඩුගණනේ අඩි 2ක් උස ආරක්‍ෂා සහිත තාප්පයකින් වටකරණු ලැබිය යුතුසි. එහි තාප්පයක් නොමැතිනම් එබඳු තාප්පයක් ප්‍රදෙශික සමිතියේ සභාපතිතැන විසින් පිළිගන්නාලද විධි ක්‍රමයක් පිට සේදීම පිණිස ගන්නා වතුර නැවතත් ළිඳට නොයනාකාර තැනිය යුතුසි. තවද සභාපතිතැනට සතුටුදායක අන්දමට කුණුවතුර නැවතත් ළිඳට යාම වලක්වන ප්‍රමාණ පලල ඇත්තාවූ කාණුවකට වතුර ගලා යන ආකාර බෑවුම ඇතුව ළිඳවටේ කිට්ටුවෙන් තිබෙන භූමිය ගලින් හෝ ගල් සහ සිමෙන්තියෙන් බැන්ද යුතුසි.

7. බාල්දි පාවිච්චිකරණු ලැබේනම් ඒවා දවස්පතා පවිත්‍රකර අවුරුද්දකට දෙවරක් බැගින් තීන්ත ගෑයුතුසි. ලොකු ටැන්කි හෝ නාන භාජන පාවිච්චිකරණු ලැබේනම් එහි වතුර පල්වීම හෝ අන්තරාය සහිතවීම හෝ මනුෂ්‍යයින්ගේ නෑමට අයොග්‍යවීම වලක්වනාකාර නිතරම වතුර මාරුකළ යුතුසි.

8. වසංගත නොහොත් බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ ප්‍රසිඞ නාන ස්ථානයක් භාරකාරයා දැනුවත්ව එබඳු රෝගයකින් ලහදී පෙළී සිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙලන රෝගාතුරයෙකුට සාත්තුකිරීමෙහි ලහදී යෙදීසිටියාවූ කෙනෙකු විසින්, සනීප ඇති කෙනෙක් එම අයට වතුර ඇද එම නාන ස්ථානයෙන් ප්‍රවෙසම් සහිත දුර ප්‍රමාණයකට රැගෙණ ගොස් පාවිච්චියට ගැනුම මිස, කිසිම ප්‍රසිඞ නාන ස්ථානයක සේදීම හෝ එහි වතුර කිසිම විධියකින් පාවිච්චිකිරීම නොකළ යුතුසි.

9. ප්‍රසිඞ නාන ස්ථානයකට වතුර ළිඳකින් සපයනු ලබනකල්හි කිසිවෙක් ඒ ළිඳේ ගවයින් හෝ වෙන සතුන් හෝ පැදුරු හෝ වෙන යම් දෙයක් හෝ ඔහු පැළඳි වස්ත්‍ර හැර වෙන රෙදි හෝ සේදීම නොකළ යුතුසි. ඒ වැළඳි වස්ත්‍ර ගලක ගැසීම හෝ වෙන විධියකින් ගැසීම උවමනානම් එයින් ඉසිරෙන දිය ළිඳට නොවැටෙන තරමේ දුරින් සිට එසේ කළ යුතුසි.

9වෙනි අතුරුපණතේ කාරණ, උවමනාකරණ වෙනස්කිරීම් ඇතුව අතරින් අතර ස්වභාවට වෙනස් මාර්ගයකින් වතුර මාරුකරණුලබණ වැව් හෝ නාන භාජන හෝ ප්‍රදෙශීක සමිතියේ සභාපතිතැනගේ අණපිට විශෙෂවශයෙන් වෙන් කර තබනලද යම් කිසි ප්‍රසිඞ නාන ස්ථානයක් සම්බන්ධවද යොදනුලැබේ.

10. කිසිම ප්‍රසිඞ නාන ස්ථානයක් අසල පැහැරීමෙන් හෝ මුත්‍රාකිරීමෙන් කිසිවෙකු විසින් දූෂ්‍ය ක්‍රියාවක් නොකළයුතුසි.

## අන්තරාය සහිත සහ අප්‍රිය (අශෝභන, අප්‍රසන්න) වෙළඳාම්.

1. මේ නියෝගවල කාරණ ගැන අනතරාය සහිත අප්‍රසන්න වෙළඳාම් යන්නෙන් මෙහි පහත දක්වන ඒවායින් කොයි එකක් මුත් හඟවන්නේය හෙවත් අන්තර්ගතවන්නේය. යන්ත්‍ර මාර්ගයෙන් සාදන පෝර ගබඩාකරතැබීම හෝ සෑදීම, ලේ හෝ නරක මස් තැම්බීම, ලේ හෝ කුණුමස් වේලීම, සම් පදම්කිරීම, සතුන්ගේතෙල උණුකිරීම, සතුන්ගේ තෙල්ගැණීම, සබන්සෑදීම, පොල්ලෙලි පෙඟවීම, කොහු සායම්කිරීම, පොල්තෙල් කම්මනතය (යන්ත්‍රසූත්‍ර යොදන තැන්වල) කොහුකම්මනතය සහ රුස්කර

7. සිසිල් බීම පුරවනු ලබන සියලුම බෝතල පෙරපු වතුරෙන් සේදිය යුතුවත් හැර ඉතාමත් පිරිසිදුව තිබෙන්ට ඕනෑය.

8. සිසිල් බීම පුරවනලද සියලුම බෝතලවල, ඒ ඒ වගීයේ නමද, සාදනලද ස්ථානයද, එය සාදනලද කර්මාන්තශාලාව අයිතිකාරයාගේ හෝ සමාගමේ නමද; ඊට ප්‍රදේශික සභාවේ සභාපතිතැන විසින් දෙනලද නොම්මරයද සඳහන් "ලේබල්" නම් පත්‍රයක් තිබිය යුතුයි.

9. අවුරුදු දෙළහෙන් බාලවූ කිසිවෙක්ද, බෝවෙන රෝගයකින් හෝ කුෂ්ඨ රෝගයකින් පෙලෙන කිසිවෙක්ද, සිසිල් බීම හෙවත් එයරේටඩ් වෝටර්ස් සාදන කර්මාන්තශාලාවක වැඩක යොදන්ට යුතු නැත.

10. සිසිල් බීම බෝතලවල ගෑස් පුරවන වැඩේ යෙදී සිටින සියලුමදෙනා ඒ වේලාවේදී සියුම් සිදුරු ඇති කම්බිවලින් සාදනලද, මුහුණුවැස්මක්ද, බෙල්ල ප්‍රවේසමට වැස්මක්ද, හම්වලින් සාදනලද අත් මේස්ද ඇඳ සිටිය යුතුයි.

11. ප්‍රදේශික සභාවේ සභාපති තැනට හෝ පරීක්ෂක කෙනෙකුට හෝ සභාවේ කළමනාකාර කෙනෙකුට හෝ වෙනත් සභාපතිතුමාගේ ලියවිල්ලකින් ඊට බලයලත් අයෙකුට හෝ එයරේටඩ් වෝටර්ස් නම් සිසිල් බීම සාදන හෝ විකුණන ස්ථානයක් ඇර තිබුන කොයියම් වේලාවකදී නුමුත් එහි ඇතුල්වී එහි සාදනලද හෝ විකිණීමට තිබෙන ඒ ඒ වගීවල "සැම්පල්" බෝතලයක් ගැනීමට බලය තිබේ. එසේ සැම්පල් බෝතලයක් ගැනීමට ඉහතකී ස්ථානවල අයිතිකාරයා හෝ භාරකාරයා ඉඩනුදුන්නේ විනම් ඒ අය නීතියට විරුඹව වරදක් කළාවේ.

එසේ ගත්නාලද "සැම්පල්" පරීක්ෂාකිරීමට දක්ෂවූ පරීක්ෂක කෙනෙකුවෙත වහාම යැවිය යුතුයි. ඔහු විසින් ඒවා පරීක්ෂාකර බලා මනුෂ්‍යයින්ගේ පාවිච්චියට නුසුදුසුයයි හෝ නම් ඒ බව සහතිකකර ඔහු විසින් දෙන සහතිකපත්‍රය එම සිසිල් බීම මනුෂ්‍යයින්ට පාවිච්චියට ගැනීමට නුසුදුසු බව අනිත් පක්ෂයෙන් සුදුසුයයි ඔප්පුකරනතුරු සාක්ෂියක් වේ. මෙසේ මනුෂ්‍යයින්ට පාවිච්චියට ගැනීමට නුසුදුසු බවට ඔප්පුවුන යම් සැම්පලයක් සිසිල් බීම සාදන හෝ විකුණන ස්ථානයකින් ගත හොත් එහි අයිතිකාරයා හෝ කළමනාකාරයා නීතියට විරුඹව වරදක් කළාවේ.

12. සිසිල් බීම සෑදීමට වතුර ගන්නා ලින් එම වැඩේට පමණක් වෙන්කර තැබිය යුතුයි. එහි නෑම තහනම්ය.

මන්ත්‍රණ සභාප්‍රාප්ත ආණ්ඩුකාරතුමාගේ කැමැත්තට යටත්ව 1914රේ 29වෙනි නීතියේ 29A යන වගන්තියෙන් පවරණ ලද බලය පිට මිනුවන්ගොඩ ප්‍රදේශික සමිතිය මෙහි පහත දක්වන ගාස්තු අවසර පත්‍රවලට අයකිරීමට මෙයින් අදහස්කරයි.

| | අවුරුදුපතා ගාස්තු, රූ. ශ. | | අවුරුදුපතා ගාස්තු, රූ. ශ. |
|---|---|---|---|
| භෝජන ශාලා .. .. .. | 6 | සබන් සෑදීම .. .. .. | 50 |
| තේ සහ කෝපි කඩ .. .. | 3 | කොහු සායම් පෙවීම .. .. | 2·50 |
| හරක් 10 දෙනෙක් හෝ අඩුව ඇති ගාල්වලට .. | 5 | යන්ත්‍ර මගින් වැඩකරන පොල්තෙල් කර්මාන්තශාලා | 100 |
| සෑම වැඩිපුර 10 දෙනාට රුපියල් 5 පටන් .. | 100 | කොහු හස්තකර්මාන්තය සහ රැස්කිරීම .. | 25 |
| එලදෙන්නු 3 දෙනෙක් හෝ ඊට අඩුවෙන් සිටින කිරි වෙළඳාම්පලවල් .. .. | 3 | හොන්ඩර 5කට වැඩිව උම්බලකඩ රැස්කිරීම .. | 5 |
| එලදෙනුන් 3න් දෙනෙකුට වැඩි නම් .. | 6 | හම්, ඇට, අතින් සාදන පෝර හෝ අතින් සාදන පෝර සෑදීම පිණිස ගන්නා ද්‍රව්‍යයන් ප්‍රමාණයෙන් එක ගෝනියකට වඩා රැස්කර තැබීම .. | 10 |
| රෙදි අපුල්ලන ස්ථාන .. .. | 3 | කළුගල් හෝ කබුක්වළවල් .. .. | 50 |
| පොදු නවාතැන්පලවල් .. .. | 6 | ගඩොල් හෝ උළු කර්මාන්තය .. .. | 15 |
| පෝර හස්තකර්මාන්ත ශාලාවල් .. .. | 100 | හුනු පෝර්න .. .. .. | 12 |
| ලේ හෝ කැපි ලේ තැම්බීම හෝ වේලීම .. | 100 | සිසිල් බීම කර්මාන්ත ශාලා .. .. | 100 |
| සම් පදන්කරණ ස්ථාන .. .. | 100 | මිනීරන්මඩු හෝ සුඹකරණ ස්ථාන .. | 50 |
| සතුන්ගේ තෙල් උනුකිරීම හෝ ගැනීම .. | 50 | | |

දැන්වීම.—භෝජන ශාලා, තේ සහ කෝපි කඩ, සාමාන්‍ය නවාතැන්පලවලටත් ගෙවන ගාස්තු අවුරුදු භාගයකට වතාවක් බැගින් පළමුවෙන් ගෙවන්ට පුළුවන.

---

## ඉඩම් විකිණීම.

**No. 3,129, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 9වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ බෙන්තොට වලල්ලාවිටිකෝරලේ කොඩාගයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

සිතියම 10,798. ගම—පොල්අතුපලාත. මෙම ඉඩමට අයිතිකමකියන්නෙක් නැහැ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | ලැලිහේත්තුවේ මානන්ගොඩැල්ල | — .. | පතන (විකුනන්නේ නැහැ) | 0 0 0 | —* |
| | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | |
| 2 | එම .. | — .. | බැද්ද (විකුනන්නේ නැහැ) | 0 1 7 | —† |
| 3 | එම .. | ඇල්. පී. ඒ. වික්‍රමරත්න කෝරලේ ආරච්චි කොස්ගොඩ .. | බැද්ද .. | 1 0 10 | 60 |
| 4 | ලැලිහේත්තුවේ පොල්ලැව්ව .. | එම .. | එම .. | 1 0 13 | 60 |
| 5 | එම .. | — .. | බැද්ද (විකුනන්නේ නැහැ) | 0 0 13 | —† |

* ආණ්ඩුව අයිතිකම් නොකියන ඉඩම. † තහනම් ඉඩම්.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 22වෙනි දින කොළඹ
මහ ලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වෙනුව.

**No. 3,130, S. P.**—දකුණු දිසාවේ මහාඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 16වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ බෙන්තොට වලල්ලාවිටිකෝරලේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

සිතියම 10,698. ගම—පිටිගල. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | මොරන්දිගොඩ | .. පිටිගල පදිංචි ඒ. ඇම්. අන්දෙරිස් | .. බැද්ද | .. 1 3 17 | 62·50 |

මේ ඉඩම් ගැන වැඩිදුර කාරනා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 23වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වෙනුවට.

---

**No. 3,131, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 16වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ ගහබොඩපත්තුවේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 11ක්.

සිතියම 10,699. ගම—ඉහළකිඹිය. අයිතිකමකියන්නා—යූ. ඇල්. ඇම්. මොහාමඩ් සහ සහෝදරයෝ.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 11 | ගන්ඉමේකන්ද | .. — | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 1 1 3 | 72·50<br>10·25 |
| 12 | එම | .. — | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 1 0 2 | 72·50<br>0·84 |
| 13 | එම | .. — | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 1 0 9 | 72·50<br>7·56 |
| 14 | එම | .. ඉහළකිඹියේ පදිංචි එච්. ඩබ්ලිව්. කරෝලිස් | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 1 0 8 | 72·50<br>6·48 |
| 15 | එම | .. — | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 0 3 39 | 72 50<br>90 0 |
| 16 | එම | .. — | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 1 0 8 | 72·50<br>19·44 |
| 17 | එම | .. — | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 0 2 24 | 72·50<br>1·44 |
| 18 | එම | .. — | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 1 2 12 | 72·50<br>22·32 |
| | | අයිතිකමකියන්නා—රජසන්තක. | | | |
| 19 | එම | .. — | .. බැද්ද | .. 1 2 13 | 72·50 |
| | | අයිතිකමකියන්නා—යූ. ඇල්. ඇම්. මොහාමඩ් සහ සහෝදරයෝ. | | | |
| 20 | එම | .. — | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 1 3 19 | 72·50<br>13·68 |
| 21 | එම | .. — | .. බැද්ද සහ වත්ත<br>වැවිල්ල | 1 0 20 | 72·50<br>9·36 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරනා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 23වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වෙනුවට.

---

**No. 2,134, N.W. P.**—වයඹ දිසාවේ පුත්තලම සහ හලාවත උපඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 7වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට මාරවිල තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන් යෙදෙනවා ඇත. වයඹ දිසාවේ හලාවත දිස්ත්‍රික්කුවේ දකුණු පිටිගල්කෝරලේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 26ක්.

සිතියම 4,749.—බන්ඩිරිප්පුව. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හොරගහකුඹුර | .. ආණ්ඩුව | .. දෙනිය | .. 2 2 8 |
| 1a | එම | .. එම | .. එම | .. 0 0 11 |
| 1b | එම | .. එම | .. විකුණනුනොලැබේ | .. 0 0 13 |
| 1c | එම | .. එම | .. එම | .. 0 0 31 |
| 1d | එම | .. එම | .. දෙනිය | .. 0 0 24 |
| 2 | කුරුදුගහේනේවත්ත | .. එම | .. ඇස්. විජේතුංග අල්ලාගෙන තිබේ | .. 0 0 24 |
| 3 | අඹගහවත්ත | .. එම | .. ටී. මර්තීනු පේ‍්‍රරා සහ තවත් අය විසින් අල්ලාගෙන තිබේ | 0 2 17 |
| 4 | කන්දේවත්ත | .. එම | .. ඉසබෙල් ප්‍රනාන්දු සහ තවත් අය විසින් අල්ලාගෙනතිබේ | 0 0 16 |
| 5 | හොරගහවත්ත | .. එම | .. ඇම්. එලාරිස් වෙදරාල විසින් අල්ලාගෙන තිබේ | .. 0 1 2 |
| 6 | එම | .. එම | .. බස්තියන්අප්පු විසින් අල්ලාගෙන තිබේ | .. 0 0 31 |
| 7 | එම | .. එම | .. ඩබ්ලිව්. කොරනිස්අප්පු විසින් අල්ලාගෙන තිබේ | .. 0 1 23 |
| 8 | අඹගහකුඹුර | .. එම | .. ඩී. වී. සිරිවර්ධන සහ තවත් අය විසින් අල්ලාගෙනතිබේ | 2 3 35 |

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 9 | කහටගහවත්ත | ආණ්ඩුව | ඩබ්ලිව්. ඇම්. රාජපක්ෂ විසින් අල්ලාතිබේ | 0 0 11 |
| 10 | මල්අගාරේ | එම | දෙනිය | 8 2 17 |
| 11 | හොරගහවත්ත | එම | සපරමාදු විසින් අල්ලාතිබේ | 0 0 31 |
| 12 | කුරුදුහේනේවත්ත | එම | ජූසේ කුරේරා පොලිස් මුලාදෑනියා විසින් අල්ලා තිබේ | 0 0 4 |
| 13 | කහටගහවත්ත නොහොත් අඹගහවත්ත | එම | ජේම්ස් අප්පු විසින් අල්ලා තිබේ | 0 0 5 |
| 14 | මිල්ලගහවත්ත | එම | සවරියල් අප්පුහාමි විසින් අල්ලා තිබේ | 0 0 16 |
| 15 | කහටගහවත්ත | එම | මර්තීනු පේ‍්‍රරා විසින් අල්ලා තිබේ | 0 0 4 |
| 16 | එම | එම | එම | 0 0 4 |
| 17 | එම | එම | මනුවෙල් පුල්ලේ විසින් අල්ලා තිබේ | 0 2 0 |

සිතියම 4,657. ගම—නඟුලඑළිය.

| | | | | |
|---|---|---|---|---|
| 1 | තන්නිකනවත්ත | ඩබ්ලිව්. පී. ග්‍රිගෝරිස් ප්‍රනාන්දු | විකුණනු නොලැබේ | 0 2 31 |
| 2 | එම | එම | ප්‍රන්සිස් ප්‍රනාන්දු විසින් අල්ලා තිබේ | 4 1 2 |

සිතියම 4,787.—පලුවැල්ගාල.

| | | | | |
|---|---|---|---|---|
| 1 | කහටගහවත්ත | ආණ්ඩුව | ගුස්තිනා රීදී සහ එලාරීසා හේනයා අල්ලා තිබේ | 0 0 19 |
| 5 | කුරුකැප්පිටියවත්ත | එම | අන්නමලේ සෙට්ටි විසින් අල්ලා තිබේ | 0 1 1 |

සිතියම 3,765.—තොඩුවාව.

| | | | | |
|---|---|---|---|---|
| 16407 | වැල්ලබඩ | ආනා ප්‍රනාන්දු සහ ඇල්. ජෝකිනුඅප්පු | පොල්වත්ත | 0 1 15 |

සැලකියයුත්තක්.—සාමාන්‍ය අක්කරයක වටිනාකම රුපියල් 15 සිට රුපියල් 200 දක්වා වේ.

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරනා පූත්තලම සහ හලාවත උපප්ජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ ප්ලෑන් සම්බන්ධව සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

මේ 1918ක්වූ මාර්තු මස 23වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

No9. 2,028, N.C. P.—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1918ක්වූ මැයි මස 15වෙනි දිනවූ බදාදා පස්වරු 1ට අනුරාධපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කුවේ හුරුළු සහ කලාගම් පලාත්වල පිහිටාතිබෙන බිම්කැබලි 40ක්.

සිතියම 5,093. ගම—උඩුරුවකෝරලේ ගල්වඩුගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 2 | අස්වැද්දුමේකුඹුර | — | අබේරත්න හිටපු ආරච්චිල විසින් අල්ලාගත් කුඹුර | 0 1 10 | 15 |
| 3 | ගල්වඩුගමකැලේ | වනසිංහාවිකාර සිඹාපී නායක උන්නාන්සේ | ලඳුකැලේ | 0 3 14 | 18 |

සිතියම 5,139. ගම—මාටඹුවාකෝරලේ හබරනේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | අක්කරඉඩම | — | ඔයට ඉතුරුකර තිබෙන බිම | 0 3 15 | —* |
| 2 | එම | — | කැලේ | 1 2 8 | 17·50 |
| 3 | එම | — | පාරට ඉතුරුකර තිබෙන බිම | 0 0 33 | —* |
| 4 | එම | සෙව්වාගේ කපුවා | කැලේ | 5 2 25 | 25 |
| 5 | අක්කරලන්ද | කුමාරගේ පෙත්තා | එම | 3 0 5 | 17·50 |

සිතියම 5,145. ගම—උලගල්ලකෝරලේ අලිත්තාන.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | අවුනේඅක්කරය | අලිත්තානේ කේ. මැනික්රාල | වියට සුදුසු කැලේ | 0 1 37 | 15 |
| 2 | එම | — | වාන්ඇලට ඉතුරුකර තිබෙන බිම | 0 0 30 | —* |
| 3 | එම | — | එම | 0 0 27 | —* |
| 4 | එම | — | වියට සුදුසු කැලේ | 0 1 37 | 15 |

සිතියම 5,147. ගම—කිරලවකෝරලේ කලුආරච්චියාගම.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | දිවුල්ගහහේන | කලුආරච්චියාගම කේ. කුඹාහේනය සහ තවත්අය | වියට සුදුසු කැලේ | 2 0 12 | 15 |
| 2 | රත්වාගොඩියාවෙල | — | කේ. කපුවා විසින් අල්ලාගත් කුඹුර | 3 1 27 | 15 |
| 3 | දඹගහහේන | කලුආරච්චියාගම කේ. කපුවා | වියට සුදුසු කැලේ | 1 1 39 | 15 |

සිතියම 5,158. ගම—හැගම්පහකෝරලේ ඉහලගම.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | කිරියගහහේන | ඉහලගම කේ. ඇම්. හේවහාමි | හේන | 2 0 0 | 15 |
| 2 | දන්ගහහේන | ඉහලගම එච්. ඇම්. බන්ඩා හිටපු ආරච්චි | එම | 1 3 33 | 25 |
| 3 | එම | — | එම | 1 2 21 | 20 |
| 4 | එම | — | අඹිපාරට ඉතුරුකර තිබෙන බිම | 0 0 25 | —* |
| 5 | පුරානවෙල්ඉහල | ඉහලගම එච්. කේ. ඇම්. කපුරුහාමි | වියට සුදුසු කැලේ | 3 0 15 | 15 |
| 6 | සියඹලාගස්හුඹව | ඉහලගම ඇම්. හේවහාමි | එම | 5 1 14 | 17 |

සිතියම 5,165. ගම—මාටඹුවාකෝරලේ උඩකඹවල.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | අනුගහලන්ද | පළුගස්වැවේ කේ. අඹරගේ | කැලේ | 1 0 31 | 15 |
| 2 | එම | — | පඹිපාරට සහ කරත්තපාරට ඉතුරුකර තිබෙන බිම | 0 0 29 | —* |

සිතියම 5,166. ගම—හැගම්පහකෝරලේ ගල්නෑව.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | පළුගහවිලයාය | ගල්නෑවේ කේ. හේරත්හාමි | ලඳුකැලේ | 3 0 9 | 18 |

සිතියම 5,167. ගම—උලගල්ලකෝරලේ විගස්ගම.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | දිවල්ගහඅක්කරේ | දිවුල්වැවේ පී. කන්දේවල් පේඩියා සහ තවත් 12ක් දෙනෙක් | වියට සුදුසු කැලේ | 5 2 30 | 16 |

සිතියම 5,168. ගම—කිරලවකෝරලේ හම්මිල්ලෑව.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | දඹගහමුලහේන | ඇස්. බන්ඩිරාල | වියට සුදුසු කැලේ | 0 3 38 | 15 |
| 2 | එම | — | ඇලට ඉතුරුකර තිබෙන බිම | 0 1 2 | —* |
| 3 | ගලපාඋලහේන | වී. කිරිබන්ඩා | වියට සුදුසු එලිකරපු හේන | 1 0 4 | 15 |
| 4 | එම | — | ඇලට ඉතුරුකර තිබෙන බිම | 0 2 1 | —* |

සිතියම 5,169. ගම—කිරලවකෝරලේ හම්මිල්ලෑව.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | සියඹලාගහහේන | වී. කිරිබන්ඩා | වියට සුදුසු කැලේ | 0 3 38 | 15 |

* විකුණනු නොලැබේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | | සිතියම 5,172. ගම—මාටඹුවාකෝරළේ ගලපිටගල. | | | |
| 1 | අඹගහකුඹුර | .. ගලපිටගල ඇල්. ඒ. ලෝරන්ස් අප්පු | .. වත්තට සුදුසු කැලේ | .. 0 2 3 | 25 |
| 2 | අක්කරවෙල | .. — .. | .. කේ. හිංගිරාල විසින් අල්ලාගත්කුඹුර | 0 1 10 | 25 |
| 3 | අඹගහකුඹුර | .. — .. | .. පාරට ඇර තිබෙන බිම | .. 0 0 17 | —* |
| 4 | පනක්කාගහකුඹුර | .. ගලපිටගල ඇම්. ඇල්. අප්පුරාල | .. වියට සුදුසු කැලේ | .. 2 2 12 | 15 |
| 5 | අඹගහකුඹුර | .. ගලපිටගල ඩබ්ලිව්. වී. මැනික්රාල | .. එම .. | .. 2 1 28 | 20 |
| | | සිතියම 5,173. ගම—උඩගල්ලකෝරළේ පසිරිමඩුව. | | | |
| 1 | දඹගහඅක්කරේ | .. — .. | .. පාරට ඇරතිබෙන බිම | .. 0 0 25 | —* |
| 2 | එම | .. කටුකැලියාවේ එච්. ඇල්. ආර්. කිරිබත්බා වෙල්විදානේ .. | .. වියට සුදුසු කැලේ | .. 1 0 7 | 15 |
| 3 | එම | .. — .. | .. පී. මිකිරාල සහ තවත් එක්කෙනෙක් විසින් අල්ලාගත් කුඹුර | .. 0 1 25 | 25 |
| | | සිතියම 5,175. ගම—මාටඹුවාකෝරළේ සේනාදිරියාගම. | | | |
| 1 | පළුගහකුඹුර | .. සේනාදිරියාගම බී. කිරිහාමි | .. ලඳුකැලේ .. | .. 2 1 25 | 17.50 |
| 2 | එම | .. — .. | .. එම .. | .. 0 2 4 | 16 |
| 3 | එම | .. — .. | .. පාරට ඉතුරුකර තිබෙන බිම | .. 0 0 38 | —* |

* විකුණනු නොලැබේ.

මෙම ඉඩම් ගැණ වැඩිපුර කරුණු උතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේ ගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 23වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මාලුකඩයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 16,652. ගම—කරගම්පිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කෝන්ගහලන්ද .. | පොල් සහ කොස්ගස්ද අතුහෙවිල්ලපු ගෙයක්ද තිබේ .. | ඇම්. ඒ. සිරිවර්ධනහෝනා .. | 0 3 6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රෙල් මස 22වෙනි දින උදේ 11.30 කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 20වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—බදුළු රේල්පාර කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

ඇස්. බී. ගමේ අන්තිම සිතියම 112. ගම—යටිකිඳ රිල්පොලකෝරළේ මයිලගස්තැන්න.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2*ac* | එලදළුව | .. අවුරුදු 10ක් වයස්වූ තේ | .. වෝල්ටර් ස්ටුවට් මහතා | .. 0 0 6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රෙල් මස 30වෙනි දින දවල් 1ට කනිසමට බදුළු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 20වෙනි දින බදුළු කච්චේරියේදීය.

ඇප්. බාව්ලව්,
ඌවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## ඉඩම් ආණ්ඩුවට ගැනීමේ දැන්වීම.

නැගෙණහිර දිසාවේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කේ තම්බලගම්පත්තුවේ චේනන්වඩි යන ගමේ පිහිටා තිබෙන්නාවූද, අක්කර තුණකුත් රූඩ් එකකුත් පර්චස් දෙකක් වපසරිය ඇතිවූද මීට අමුනා තිබෙන සැබුල් පත්‍රයේ විස්තර සටහන්වූද ඉඩම් කැබැල්ල ආණ්ඩුව විසින් සහ ආණ්ඩුව වෙනුවෙන් ලියාදෙන ලද්දේවීනමුත් එය දැනට අවුරුදු අටකට වැඩි කාලයක් මුළුල්ලේ අයිතිකාරයන් විසින් අත්හැරදමා තිබෙන බව පෙණෙන නිසා මා විසින් කඩිසරවූද සැහෙන්නාවූද සියලුම වගවිභාගකරණලැබූ නමුත් එබඳු අයිතිකාරයන්වත් නීති ප්‍රකාර අයිතිකමක් කියාසිටින කෙනෙක්වත් සොයාගන්ට බැරිබැවින් නැගෙණහිර දිසාවේ ආණ්

ඩුවේ ඒජන්තධූරන්ධර රිචර්ඩ් ආර්තර් ග්‍රිණ්ඩෝල් ෆේපස්ට්ං යන මා වසී 1887තේ අංක 4 දරණ ආඥාපණතෙන් මට ලැබී තිබෙන බලපූළුවන්කම් කරණකොටගෙණද ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන් සේගේ සම්මතය ඇතුවද මෙයින් ප්‍රකාශකරණ වගනම්—එකී ඉඩමට තම අයිතිකම ඔප්පුකලහැකි කෙනෙක් විසින් හෝ එබදු අයෙක් වෙනුවෙන් කෙනෙක් විසින් හෝ වසී 1919යේ අප්‍රේල් මස 19වෙනි දින හෝ ඊට මත්තෙන් අයිතිකම මට කියා නොසිටියොත් එම ඉඩම එකී ආඥාපණතේ 2වෙනි වගන්තියේ ප්‍රකාර ආණ්ඩුව විසින් ආපසු ගන්නාබව ඊට වැදගන්නා සියල්ලෝම දනගනිත්වා.

මා විසින් අත්සන්කොට මඩකලපුවේ කච්චේරියේදී දෙන්ට යෙදුනේ වසී 1918ක්වූ පෙබරවාරි මස නමවෙනි දිනදීය.

ආර්. ඒ. ජී. පැස්ට්ං,
නැ. දි. ආණ්ඩුවේ ඒජන්ත වම්ශ.

---

එකී හැඩුල් පත්‍රය.

ත්‍රිකුණාමලේ තම්බලගම් පත්තුවේ චේනන් වඩියේ පිහිටා තිබෙන අංක 711යේ මුල් සිතියමේ (වයිටල් පලෑන 103,574) අංක 8,821 ලකුණුකර තිබෙන ඉඩම්කැබැල්ල.

මායිම්—බස්නාහිරට ආණ්ඩුවට අයිතිය කියන ඉඩම අනිත් සියලුම පැතිවලට "තෝනා" නම් දියවළ.

වපසරිය—අක්කර 3යි රූඩ් 1යි පර්චස් 2යි.

මෙම ඉඩම 1876යේදී කාදර් මියදින් සින්නතම්බිට ආණ්ඩුවේ ඔප්පුවක් පිට ලියාදෙනලදී.

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

ආණ්ඩුව සන්තක ඉඩම් මැණීමේ අයදුම්පත්‍ර පිළිබඳව උතුරු මධ්‍යම පලාතේ අවසාන කරණු ලබන භූමි ප්‍රදේශ.

උතුරු මධ්‍යම පලාතේ ආණ්ඩුව සන්තක ඉඩම් මුදලට හෝ බද්දට ගැණීමේදී යවනු ලබන අයදුම් පත්‍ර සම්බන්ධව පවත්වනු ලබන මැණීම් එම භූමිවල අක්කර ප්‍රමානයේ හැටියට මින් ඉදිරියට භාරගන්නා බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එම පලාත ප්‍රදේශ තුනකට බෙදා තිබේ. කුන්චුත්තු, කල්පේ, මහාපොතාන, කහාදර සහ උඩ්ඩියන්කුලම්කෝරල අඞ්ක 1 දරණ ප්‍රදේශයට ඇතුලත්වද, උලගල්ල, කලාගාම්, තීගම්පහ, උන්දරුව, කිරලාව, මාම්තිය සහ මාතොම්බුව, කෝරලද තමන්කඩුව සහ එගොඩපත්තුද අඞ්ක 2 දරණ ප්‍රදේශයට ඇතුලත්වද; විල්ලච්චිය, නුවරගම්, කඩවත්, එප්පාවල සහ කැන්දේකෝරල අඞ්ක 3 දරණ ප්‍රදේශයට ඇතුලත්වද වේ.

3. වසී 1918ක්වූ මැයි මස 1වෙනි දින අඞ්ක 1 දරණ භූමි ප්‍රදේශයේ කටයුතු අවසාන කරනු ලැබේ. මෙහි තුල පිහිටි ඉඩම් සම්බන්ධ යවනලද අයදුම්පත්‍ර ඉහතකී දිනට පසු එම ඉඩම් මැණීම පිණිස සර්වේයර් ජනරල් උන්නාන්සේ වෙත යවනු නොලැබේ. එසේදලවත් ඉඩම් විකිණීම හෝ බද්දට යම් විරුඩකම් තිබේදැයි දැනගැනීමට එකී ප්‍රදේශය තුළ ඉඩම් ගැන එවනලද අයදුම්පත්‍ර රිජිස්තර් කිරීම පිණිස මා වෙත එවීම වලක්වනු නොලැබේ.

4. මීට පසු මැණීම පිළිබඳව අවසානකරණු ලබන්නේ අඞ්ක 2 දරණ ප්‍රදේශයද ඊට පසු පිළිවෙළින් අඞ්ක 3 දරණ ප්‍රදේශයද වේ. මෙකී භූමි ප්‍රදේශ 2 තුළ ආණ්ඩුව සන්තක ඉඩම් මිලේට හෝ බද්දට ගැණීම පිණිස එවනලද අයදුම්පත්‍ර නොපමාව මාවෙත එවිය යුතුයි.

5. අඞ්ක 2 දරණ භූමි ප්‍රදේශයේ අයදුම්පත්‍ර භාරගැණීමේ අවසානකරණ දිනය ළඟදීම ප්‍රසිඩකරනු ලැබේ. තවද අංක 1 දරණ භූමි ප්‍රදේශයේ සියළු කටයුතු සම්පූණිකරන දිනයද ඉන් ප්‍රකාශවෙත්.

වී. ගුණතිලක,
උතුරු මධ්‍යම පලාතේ ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වසී 1918ක්වූ මාර්තු මස 18 වෙනි දියනදී.

---

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.